ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
Central Bank Pensioners' Association

# වාර්ෂික වාර්තාව
# Annual Report
# 2016

## ANNUAL REPORT 2016

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
# නිලධාරි මණ්ඩලය - 2016

| | |
|---|---|
| ගරු සභාපති | ජයලාල් ජයවර්ධන |
| ගරු උප සභාපති | ආරියදාස තන්තිරිගේ මහතා |
| ගරු ලේකම් | එච්.එම්.පී. හේරත් මහතා |
| ගරු උප ලේකම් | අමරපාල කරසිංහ ආරච්චි මහතා |
| ගරු භාණ්ඩාගාරික | ආර්.ඩී. ගුණසේන මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | එල්.එල්.එම්.ඩී. කබ්රාල් මහතා |
| ගරු විධායක කමිටුව | ජගත් කාරියවසම් මහතා |
| | කේ.බී. දිසාකරුණා මහතා |
| | ලීලා මෝහනසුන්දරම් මහත්මිය |
| ගරු සමාජයීය ලේකම් | අයිරා වැගොඩපොළ මහත්මිය |
| ගරු ගිණුම් පරීක්ෂක | කේ. ජෙගනාදන් මහතා |

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

නො.2, තිස්ස මාවත,
ගල්වලපාර, දෙහිවල

දුරකථනය : 0777 412 289
දිනය : 02.04.2017

සියළුම සාමාජික සාමාජිකාවන් වෙත,

## දැන්වීමයි.

අප සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම 2017 අප්‍රේල් මස 30 වන ඉරු දින රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ,බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. එදින පෙරවරු 9.00 ට පැමිණීම ලියාපදිංචි කිරීම ආරම්භ වේ.

### න්‍යාය පත්‍රය

01. සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම.
02. වියෝවූ සහෘදයන් වෙනුවෙන් විනාඩි දෙකක නිශ්ශබ්දතායක් පැවැත්වීම.
03. පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව කියවීම.
04. එම වාර්තාව සභා සම්මත කිරීම.
05. වාර්තාවෙන් පැනනැගෙන කරුණු ඇතොත් සාකච්ඡා කිරීම.
06. ගරු ලේකම් විසින් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.
07. ගරු භාණ්ඩාගාරික විසින් වසරේ මුල්‍ය ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම හා සභා සම්මත කිරීම.
08. ගරු සභාපතිගේ දේශනය
09. යෝජනා ඉදිරිපත් කිරීම.
10. නව වසර සඳහා නිලධාරි මණ්ඩලයක් පත් කර ගැනීම.
11. වෙනත් කරුණු

ලියාපදිංචි වීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරනු ඇත. උදෑසන තේ පැන් සංග්‍රාහය පැවැත්වෙන අතර මහා සභාවේ කටයුතු පෙ.ව.9.00 ට ආරම්භ කරනු ඇත. මහා සභාවේ කටයුතු අවසන් වීමෙන් පසු සුහඳ හමුව හා දිවා භෝජනය ද පැවැත්වෙනු ඇත. ඔබගේ ආදරණීය මිතුරු මිතුරියන් සමග පස්වරු 3.00 දක්වා රිසිසේ විනෝද විය හැකිය. මෙම අනගි අවස්ථාවට සහභාගී වීමට ඔබ සැම මහත් උනන්දුවක් ගනු ඇතැයි අපි විශ්වාස කරමු.

එච්.එම්.පී. හේරත්
ගරු ලේකම්

2.04.2017

සියළුම සාමාජික සාමාජිකාවන් වෙත,

## වාර්ෂික මහ සභා රැස්වීම 2017

ඔබ සැමගේ දැනගැනීම සඳහා පහත සඳහන් ලියවිලි මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් කරමු.

1. වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනය.
2. 2016 වාර්ෂික අයවැය
3. 2016 වාර්ෂික ගිණුම් වාර්තාව

2017 අප්‍රේල් මස 30 වෙනි ඉරිදා දින ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58, දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ. බැංකු අධ්‍යයන කේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිත අපගේ වාර්ෂික මහා සභා රැස්වීමට පැමිණෙන ලෙස ඔබට කෙරෙන කාරුණික ඇරයුමයි. මහා සභා රැස්වීමෙන් අනතුරුව පැවැත්වෙන සුහඳ හමුව සහ දිවා භෝජන සංග්‍රහය (ඒ සඳහා අය කිරීමක් සිදු නොකෙරේ.) රැස්වීම් ශාලාව පිහිටි විදුපියසේදී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

එච්.එම්.පී. හේරත්
ගරු ලේකම්

ANNUAL REPORT 2016

# 2016/2017 වාර්ෂික වාර්තාව

නෝනාවරුනි/ මහත්වරුනි,

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ 2016/2017 වාර්ෂික වාර්තාව ඉතා සතුටින් ඔබ වෙත ඉදිරිපත් කරමි. අප සියලු දෙනාම මහ බැංකුවේ විවිධ කාර්යන් වල නිරත වෙමින් එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාත් මෙරට ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම සඳහාත් ඇප කැප වී සේවය කළ අය වෙමු. ඒ අතරම මහ බැංකුව විසින් අප විශ්‍රාම ලැබීමෙන් පසුව ද අපගේ යහපත සඳහා කටයුතු කිරීම වෙනුවෙන් ඊට ස්තුතිවන්ත වෙමු. 2016 මාර්තු 12 දින මෙම ස්ථානයේ දී පවත්වන ලද වාර්ෂික මහ සභා රැස්වීමේදී සියලු සාමාජිකයින් විසින් මා ප්‍රධාන ලේකම් ලෙසින් සංගමයට පත්කරගැනීම සම්බන්ධයෙන් ඔබ වෙත මාගේ ස්තුතිය පුදකරමි.

මේ අවස්ථාවේ දී මා කැමතියි හිටපු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා කෘතඥ පූර්වකව සිහිපත් කිරීමට. එතුමා පූර්වාදර්ශයක් ලෙස 2006 දක්වා රජයේ වැටුප් වැඩිකිරීම හා බැංකු සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම පදනම් කරගෙන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප ද 2006 දක්වා වැඩි කිරීමට කටයුතු යොදන ලදී. ඒ සම්බන්ධයෙන් අප සංගමයේ පසුගිය වර්ෂයේ විධායක මණ්ඩලයට ද කරන ලද කාර්ය සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමි.

මහ බැංකුවේ කලක් සේවය කළ ජාත්‍යන්තර කීර්තියක් දරණ ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ද අධිපති ධූරය හෙබවීමත් සමඟ විශ්‍රාමිකයන්ගේ ගැටළු දුක්ගැනවිලි සම්බන්ධයෙන් එතුමාගේ විවිධ රාජකාරි මධ්‍යයේ වුව ද විශේෂ අවධානය යොමු කළ බව සඳහන් කරනු කැමැත්තෙමි.

අපගේ නිලකාලය තුලදී ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා දෙවරක් හමුවීමට හැකිවිය. හිටපු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා 2016 අගෝස්තු මස 20 දින කලටුවාව සෙරිනිටි විලේජ් හෝටලයේ දී එතුමා වෙනුවෙන් අප සංවිධානය කළ දිවා භෝජන සංග්‍රහයට ආචාර්ය

කුමාරස්වාමි මහතාට ආරාධනා කළ නමුත් නොවැළැක්විය හැකි පෞද්ගලික හේතුවක් නිසා පැමිණීමට නොහැකි බව දැන්වීමට තරම් එතුමා කාරුණික විය. කෙසේ වුවද චාරිත්‍රයක් වශයෙන් අප විසින් එතුමා පිළිගැනීම සඳහා 2016 සැප්තැම්බර් 26 දින මහ බැංකු පරිශ්‍රයේ දී කටයුතු යෙදීමට හැකිවිය. එතුමා අප සංගමයේ සියලු දෙනා උණුසුම් ලෙස පිළිගත් අතර අධිපතිවරයෙකු පළමු හමුවීමේදී සංගමයක දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සම්ප්‍රදයාණුකූල නොවූවත්, එතුමාගේ අනුමැතියෙන් අපගේ ඉල්ලීම් මාලාව ඉදිරිපත් කිරීමට හැකිවිය.

එතුමා සමඟ පැවැත් වූ දෙවන රැස්වීම 2017 මාර්තු 2 දින සම්මන්ත්‍රණ ශාලා අංක 1 දී පැවැත් වු අතර නියෝජ්‍ය අධිපති ලංකාතිලක මහතා ඇතුළු පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිහු පැමිණ සිටියහ.

**සහභාගිවූවෝ**

**මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය**

1. ගරු සභාපති ජයලාල් ජයවර්ධන
2. ගරු ලේකම් එච්.එම්.පී. හේරත්
3. ගරු භාණ්ඩාගාරික ආර්.ඩී. ගුණසේන
4. ගරු උපසභාපති ආරියදාස තන්ත්‍රිගේ
5. ගරු උප භාණ්ඩාගාරික එල්.එල්.එම්.ඩී. කබ්රාල්
6. ගරු විධායක කමිටු සාමාජික ලීලා මෝහන සුන්දරම්
7. ගරු විධායක කමිටු සාමාජික ජගත් කාරියවසම්

**ශ්‍රී ලංකා මහ බැංකුව**

1. අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
2. නියෝජ්‍ය අධිපති එස්. ලංකාතිලක
3. නීතිමය කටයුතු දෙ. අධ්‍යක්ෂක පී.වී.එල්. නන්දසිරි
4. ලේකම් සුසන්ත ආරියරත්න
5. කාර්යාල සේවා කළමනාකාර දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂක බී.ඩබ්. ජිනසේන
6. මානවසම්පත් අධ්‍යක්ෂක කේ.එම්. අබේකෝන්

මෙම සාකච්ඡාවේ දී විෂයගත ප්‍රශ්න සහ බැංකුවේ ප්‍රතිචාරය පහත දැක්වේ.

| | විෂයගත කරුණු | මහබැංකු කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය |
|---|---|---|
| 1. | සංගමයට කාර්යාල පහසුකම් ලබාගැනීම. | කො. කොටුවේ සෙන්ටර් පොයින්ට් ගොඩනැගිල්ලේ යටි මහලේ පහසුකම් ලබාදීම. 2017 අප්‍රේල් පළමු දින සිට ලැබෙනු ඇත. |
| 2. | 2010 අගෝස්තු 28 දිනට යෙදුන මහ බැංකුවේ 60 වන සංවත්රය සඳහා ප්‍රදානය කරන ලද වැටුප් වර්ධක 2010 අගෝස්තු 28 දින සහ සැප්. 30 දින අතර සේවයෙන් විශ්‍රාම ලැබූ අයට නොලැබීම. | අධිපතිතුමා සහ නියෝජ්‍ය අධිපතිතුමා මෙය සලකා බැලීමට එකඟ වූහ. |
| 3. | අපට හැඟී යන පරිදි 2006 දක්වා විශ්‍රාම ගිය නිලධාරින්ට ගෙවන ලද රු. 3500 ක් වූ නෛතිකදීමනාව සංශෝධනයේ දී ඔවුන්ට ලැබී නොමැති බව පෙනේ. මෙය ලබා දීමට කටයුතු කිරීම. | සලකා බැලීමට එකඟ විය. |
| 4. | මහ බැංකු විශ්‍රාමිකයින්ට ද අදාලව නිකුත් කරන ලද රෙගුලාසි අඩංගු චක්‍ර ලේඛනයක් නොලැබේ. | දැනට පවතින ක්‍රමය මේ සඳහා තවදුරටත් කාර්යක්ෂමව කිරීමට එකඟ විය. |

| | | |
|---|---|---|
| | විශේෂයෙන් ම අලුතින් නිකුත් කරන ලද වෛද්‍ය ප්‍රතිලාභ වලට මෙය අදාල වේ. | |
| 5. | විශ්‍රාමිකයන්ගේ විමසීම් වලට පිළිතුරු සැපයීම සඳහා (දුරකථන හා ලිඛිත පැමිණිලි) කාර්යමණ්ඩල කළමනාකාරිත්ව දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කිරීම. | මේ සඳහා දැනට නිලධාරින් ඇති නමුත් තවදුරටත් එය කාර්යක්ෂමව පවත්වා ගැනීමට එකඟ විය. |
| 6. | නිවාඩු නිකේතන වෙන්කර ගැනීමේ දී නියෝජිතයකු මාර්ගයෙන් හෝ තැපෑලෙන් එය සිදු කිරීමත් ඒ සඳහා වන අයකිරීම් මාසික විශ්‍රාම වැටුපෙන් අඩු කිරීමටත් කටයුතු කිරීම. | මෙය දැනට ක්‍රියාත්මක කර ඇති අතර අදාල චක්‍රලේඛන යැවීමට කටයුතු කෙරේ. |
| 7. | විවිධ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රම යටතේ රෝහල් ගත වීමේ දී ඒ සඳහා වන ගෙවීම් සීමාව ඇතුළු වීමට පෙර දැනුම් දීම. | මෙම සීමාවන්ට අදාලව ගෙවිය හැකි මුදල් දක්වන ලිපියක් හෝ අත්තිකාරම් මුදලක් එකී සීමාව ඇතුලත ගෙවීම දැනටම ක්‍රියාත්මක කර ඇත. |
| 8. | දෙවන ස්වේඡා විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම ලබන විට එකවර ගෙවන මුදලක් නොලැබීම. | දෙවන ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමය පළමු ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමයේ කොන්දේසි වලට වෙනස් වූ අතර ඊට එකඟව විශ්‍රාම ගොස් ඇති අයට ඒ සඳහා හිමිකම් නොලැබේ. |
| 9. | භාෂා ප්‍රතිපත්තියට අනුව විශ්‍රාම ගිය අයගේ ගැටළු. | මෙය අධිපතිතුමා සානුකම්පිතව සලකා බලනු ඇත. |

| | | |
|---|---|---|
| 10. | රැකියාවක් සඳහා පිටරට ගිය පද්මා ගුණසේකර මහත්මියගේ අභියාචනය. | මෙය නොදන්වා සේවයට නොපැමිණීම මත දශක 4 කට ඉහත සිදුවීමක් වන අතර 1963 දී සේවයේ හැර යාමෙන් පසු ඇයට අදාල හිමිකම් ගෙවා ඇත. මෙවැනි සේවය හැරයාම් සලකා බැලිය නොහැක. |
| 11. | අප සංගමයට ලැබී ඇති තොරතුරු මත 2017 අප්‍රේල් මස සිට මහ බැංකු සේවකයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ බැංකුවෙන් ලැබෙන වේතනයට වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ කරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමද එකතු කොට බදු අයකිරීමට කටයුතු කිරීමට යන බව දැන ගැනීමට ලැබීම. | අධිපතිතුමා සහ නි. අධිපතිතුමාගේ ප්‍රතිචාරය වූයේ බැංකුව විසින් මේ සඳහා ධනාත්මක ප්‍රතිචාරයක් දක්වා ඇති බවත් ඉහල බලධාරින්ගේ අනුමැතිය ඒ සඳහා ලැබීමට ඇති බවත්ය. |

ඉහත සඳහන් 11 වැනි කරුණ සම්බන්ධ තොරතුරු ලැබු පසු සභාපතිතුමා සහ මා විෂය පිළිබඳ පර්යේෂණාත්මක කරුණු එකතු කළ අතර අධිපතිතුමා වෙත ලිපියක් ද යවන ලදී. (ඇමුණුම 1)

අපගේ සොයාගැනීම් අනුව කේ. කනග සභාපති එදිරිව අදායාම් බදු කොමසාරිස් ජනරාල් SC No. 16/ 79 - CA 2/77 Inland Revenue BRA 368 (Reported in Sri Lanka Tax Cases Vol (iv) අනුව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත්තේ සේව්‍යා විසින් සේවකයා වෙත ගෙවනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීම මත ආදායම් බදු අය නොවිය යුතු බවයි.

අදාල වර්ෂය තුළ දී සංගමය සමාජීය සහ පුණ්‍ය කටයුතු වල යෙදුනි.

1. අන්වර්ථ නාමයෙන් 'ගෝමි' නමින් හැඳින්වෙන අපගේ මිත්‍රයකු විසින් එළිදක්වන ලද 'ඔබ තවමත් සුවඳ මලකි' කාව්‍ය සංග්‍රහය රාජගිරිය බැංකු කේන්ද්‍ර ශ්‍රවනාගාරයේ දී එළිදක්වන ලදී. ඔහු තරුණ වයසේ සිට කාව්‍ය නිර්මාණ පුවත්පත් සඟරා ආදියට සැපයූ අතර මෙම එකතුව එළි දක්වන ලද්දේ 2016 ජුනි 1 දින විශ්‍රාමික සංගමයේ අනුග්‍රහයෙනි. මෙම අවස්ථාවේ ප්‍රධාන දේශකයා වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතා සහභාගි වූ අතර මෙම අවස්ථාව බැංකුවෙන් විශ්‍රාම ලැබූ සහ දැනට සේවය කරන ලොකු කුඩා සියලු දෙනාගේ මතකය 1960 ගණන් වල කතුවරයාගේ තරුණ වයස මතකයට නැංවීය. මෙම පොත එළි දැක්වීමේ දී කර්තෘගෙන් ලැබුණ රු. 100 000 ක් සහ එදින පැමිණ සිටි ප්‍රේක්ෂකයන් වූ අප සංගමයේ සාමාජිකයන් වන සහ නොවන මහ බැංකුවේ දැනටත් සේවය කරන ලොකු කුඩා සියළු දෙනාගෙන් ලැබූ මුදල් සහ එතුමාගේ නෑදෑහිතමිතුරන්ගේ දායකත්වයෙන් ලැබුණු මුළු මුදල වූ රු. 292000 ක් සංගමයේ සභාපති විසින් මහරගම පිළිකා රෝහලට අවශ්‍ය වූ පෙට්ස්කෑන් යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලදී. මෙම කාර්ය ආරම්භ කරන ලද්දේ යසපාල පෙරේරා මහතා ගේ යෝජනාවක් අනුවය. ගෝමි දැනට කඩවත පදිංචි ටී.ඒ.ජී. ගෝමිස් රසවතා මිස වෙන කිසිවකු නොවේ. දැනට අසනීපයෙන් පසුවන ඔහුට අපි දීර්ඝායුෂ ප්‍රාර්ථනය කරමු.

2. දෙවනුව 2016 ජුනි මාසයේ දී ගංවතුරෙන් විපතට පත් වූ පාසැල් ළමුන් වෙනුවෙන් අප සංගමය මිලදී ගත් රු. 32 000 වටිනා පොත්පත් සහ අනෙකුත් ලිපිද්‍රව්‍ය එවැනි ළමුන් සිටින පහළ දැදුරුඔය ප්‍රදේශයේ පීඩාවන්ට පත් පාසැල් ළමුන් සඳහා කඩවත බිම්බාරමයේ විහාරාධිපතින් වහන්සේ වෙත ලබා දෙන ලදී. මේ සඳහා අරමුදල් කඩවත අවට ජීවත් වන මහ බැංකු විශ්‍රාමිකයින් සහ වෙනත් පුද්ගලයන්ගේන් ලබාගැනීමට හේතු වූයේ වෙනත් ප්‍රදේශවල බැංකු විශාමිකයින් ඒ වන විටත් ඒ ඒ ප්‍රදේශවල මෙම කර්තව්‍යය සඳහා දායක වි සිටි බැවිනි.

3. අප සංගමය මඟින් පවත්වාගෙන ගිය වකුගඩු අරමුදල එම කාර්යය සඳහා යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් නොවු බැවින් උතුරු මැද පලාතේ තෙලිගු ගම්මානයේ එවැනිම කටයුත්තක් (පානීය ජල සැපයීමක් වෙනුවෙන්) සඳහා සපයාදීමට ක්‍රියා කරන ලදී. ඒ ස්වේච්ඡා විශ්‍රාමිකයන්ගේ සංගමයේ ඉල්ලීමක් පරිදිය. අප සංගමයේ විධායක කමිටුවේ අනුමැතිය ඇතිව 2015/2016 වසර වලදි වකුගඩු අරමුදල වෙනුවෙන් ලැබූ රු. 105 000 මුදල ඒ සඳහා පරිත්‍යාග කරන ලදී.

4. සංගමයේ එක් දින චාරිකාව මෙවර කලටුවාව සෙරනිටි විලේජ් හෝටල් සංකීර්ණයේදී පවත්වන ලදී. පැරණි විශ්‍රාමිකයන් සහ ඔවුන්ගේ ඥාතීන් මෙයට සහභාගි වූ අතර පරමාර්ථය වුයේ හිටපු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් මහතාට කෘතගුණ සැලකීමත් නව අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පිලිගැනීමත්ය. 2016 අගොස්තු 20 දින මෙයට සහභාගි වූ සියලු දෙනාම ඉතා උද්යෝගයෙන් ගී ගයමින් සංගීත කණ්ඩායමේ රිද්මයට පා තැබුවේ මහේන්ද්‍රන් මහතා දීර්ගායුෂ හා සෞභාග්‍ය පතා සමුගැනීමෙන් පසුව ය. සංගමයේ පැරණි සාමාජිකයන් මෙහි සංවිධාන කටයුතු අගය කළ අතර බැංකුව ආරම්භයේ දී සිදු වූ යම් යම් දේ අනුස්මරණය කරමින් සතුටු විය.

5. දින තුනක සංචාරය මෙවර මාර්තු 3 සිට 5 දක්වා සිංහරාජ අඩවිය අසල සූරිය කන්දේ පිහිටි ජෝන් මේරි වියනේ ක්ලර්ජිහවුස් නේවාසිකාගාරයේ ගත කෙරිණ. එහි නේවාසික හා ශාලා පහසුකම් මනාව සපයා තිබූ අතර සහභාගි වු අයගේ පැමිණිල්ල වුයේ දේශගුණය සීතල බවයි. දෙවන දවස රාත්‍රියේ දී දිගහැරුණු සංගීතයත් සමඟ ඒ සීතල පහව ගොස් ඇති බව පෙණිනි.

6. මෙම සංචාරයේ දී සිංහල රජු දවස ප්‍රාදේශීය පාලකයන්ගේ ජීවන රටාව අවබෝධ කර ගැනීම සඳහා මඩුවන්වෙල වලව්ව නැරඹීමට ද හැකිවිය. ආපසු පැමිණීමේ දී තංගල්ල මුහුදු තීරයේ ගතකර Ceylon Sea හෝටලයෙන් ප්‍රනීත දිවාභෝජනයක් රසවිඳීමෙන් අනතුරුව මාතර කොළඹ අධිවේගී මාර්ගය ඔස්සේ කොළඹට සැපැත්විය.

මෙම වර්ෂය තුළදී සංගමයේ වෙබ් අඩවිය යාවත් කාලීන කරන ලද්දේ සංගමයේ ව්‍යවස්ථාව සංග්‍රහය ඊට ඇතුලත් කරමිනි. එසේම සාමාජිකයන්ගේ තොරතුරු සමඟ වෛද්‍ය ප්‍රතිලාභ සඳහා හිමිකම් පෑමේ ආකෘති පත්‍ර ආදියත් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබීය.

අදාල කාලය තුළ දී අපගේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමිකයන්ගේ නිවෙස් වලට ගොස් ඔවුන් සමඟ කතාබස් කොට දුක සැප බෙදා ගැනීමට ද උත්සුක වූහ. ඒ අතර එඬේරමුල්ලේ දැව කලාකරුවකු වන ජේ.එම්. පොඩි අප්පුහාමි, කිරිබත්ගොඩ කේ.ටී. සිරිසේන යන රෝගී තත්වයෙන් පසුවන සාමාජිකයන් බැලීම සදහා ඔවුන්ගේ නිවෙස්වලට ගොඩ වැදුනෙමු. තවද මෑතක සිට අසනීපයක් පසු වනපැට්ට්‍රිෂියා නෙල්සන් මෙනවිය බැලීම සදහා කලුබෝවිල රෝහල වෙත යාමට ද අමතක නොකළෙමු.

හික්කඩුවේ පදිංචිව සිටි එච්.ඊ. ගුණවර්ධන මහතා (වි.අ.30) අවු. 107 ක් ආයු වළදා 2016 මාර්තු 16 දින අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ අපගේ සාතිශය සංවේගය පලකරමු.

අප සංගමයේ සැදෑව සඟරාව සියලුම වැදගත් කරුණු සංග්‍රහ කොට සාමාජිකයන් වෙත ඉදිරිපත් කිරීමට දැඩි වෙහෙසක් ගන්නා අමරපාල  කරසිංහ ආරච්චි මහතාට ස්තුතිය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

අප සංගමයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අප දිරිමත් කළ විධායක කමිටුවේ සියලු සමාජිකයන් මෙන්ම  සංගමයේ සෙසු සාමාජිකයන්ටද විධායක කමිටුව වෙනුවෙන් මාගේ හර්දයාංගම ස්තුතිය පල කිරීමට මෙය අවස්ථාවක කර ගනිමි.

සංගමයේ සේවාදායකයන් වන ග්‍රැෆික් වර්ල්ඩ් ආයතනයට සෙරිනිටි හොටෙල්හි කළමනාකාරිත්වයට, සූරිය කන්ද සංචාරය සඳහා කටයුතු සම්පාදනය කරදුන් එමිල් ප්‍රනාන්දු පියතුමාට ද අපගේ ස්තුතිය පලකරමි.

එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාට අපගේ කෘතඥතාව පලකරමු. නියෝජ්‍ය අධිපති ලංකා තිලක මහතා, නීති කටයුතු අධ්‍යක්ෂ ලක්ෂ්මන් නන්දසිරි මහතා, ලේකම් සුසන්ත ආරියරත්න මහතා, කාර්යමණ්ඩල කලමනාකාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජිනසේන මහතා, මානව සම්පත් අධ්‍යක්ෂ අබේකෝන් මහතා, පහසුකම් කළමනාකාරිත්ව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එච්.බී.ඩී. කරුණාරත්න මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ද ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එස්.එච්. ගුණවර්ධන මෙනවිය ඇතුලු කාර්ය මණ්ඩලයට හා බැංකු අධ්‍යාපන කේන්ද්‍රයේ අධක්ෂ යූ.එච්.ඊ. සිල්වා මහතා ඇතුළු කාර්යමණ්ඩලයටද මහ බැංකු විශ්‍රාමික සංගමයේ විවිධ කටයුතු වලට සහයෝගය දැක්වීම වෙනුවෙන් සාමාජිකයන්ගේ ගෞරව පූර්වක ස්තූතිය හිමිවේ.

ලේකම්,

2017. 04. 30 එච්.එම්.පී. හේරත්

## යෝජනා

1. ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ දැනට ක්‍රියාත්මක වන අවමංගල්‍ය සහනාධාර ක්‍රමය දිනෙන් දින සංගමයට දරාගත නොහැකි වැය ශිර්ෂයක් වී ඇත.වර්ෂ කීපයක දත්තයන් මෙසේය.

| වර්ෂය | මුදල | | සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|
| 2011 | රු. 190000/ | 19 | රු. 10000/ බැගින් |
| 2012 | රු. 475000/ | 22 | රු. 10000/බැගින් (17) |
| | | | රු. 25000/ බැගින් (5) |
| 2013 | රු. 575000/ | 23 | රු. 25000/ |
| 2014 | රු. 775000/ | 31 | රු. 25000/ |
| 2015 | රු. 425000/ | 17 | රු. 25000/ |
| 2016 | රු. 525000/ | 21 | රු. 25000/ |

අරමුදලක් රහිත සහනාධාර ක්‍රමයක් වන මෙමගින් සාමාජිකයකුගේ අභාවයකදී රු. 25,000/ ගෙවනු ලබන්නේ මාසික සාමාජික දායක මුදලිනි. වාර්ෂිකව මෙය ඉහළ අගයක් ගන්නා බවන වාර්තා අනුව පෙනී යයි. ක්‍රම ක්‍රමයෙන් දායකත්වය අඩුවීමත් පිරිනැමීම ඉහළ යාමත් සිදු වෙමින් පැවතීම සලකා බැලිය යුතු සංසිද්ධියකි.

පසුගිය විධායක කමිටු මගින් පවා මහ බැංකුවේ දායකත්ව මරණාධාර ක්‍රමයට විතැන්වීම වඩා යහපත් බවට සාමාජිකනත්වයට දැනුම් දී ඇත.

එබැවින් අප විශ්‍රාමික සංගමයේ හෙට දිනය ගැන සිතා බැලීමේදී දැනට ක්‍රියාත්මක වන මෙම අවමංගල්‍ය සහනාධාර ක්‍රමය (රු. 25000/) අහෝසිකර ඒ වෙනුවට මහ බැංකු විශ්‍රාමික සංගමයේ දායකත්ව මරණාධාර ක්‍රමයට පරිවර්තනය විය යුතු බව ඉවත්ව යන විධායක කමිටුව ගරු සභාවට යෝජනා කරන්නීය.

**යෝජනාකරු විධායක කමිටුව 2016**

02. වර්ෂ 2008 පමණ සංගමය මගින් මුද්‍රණය කළ විශ්‍රාමිකයින් අත්පොත 2016 දක්වා සංශෝධනය කර නැවත මුද්‍රණය කිරීමට හෝ 2008 ට පසුව විශ්‍රාමික ගිය පුද්ගලයින්ගේ විස්තර අලුත් ප්‍රකාශනයක් ලෙස මුද්‍රණය කරන ලෙස අපි යෝජනා කරමු.

යෝජනාකරු
ඩබ්ලිව්.පී.එස්. ප්‍රනාන්දු
ජී.කේ.ද සොයිසා
ආරියදාස තන්ත්‍රිගේ

ස්ථිරකරු
ඩබ්ලිව්.ආර්.එස්.මෙන්ඩිස්
එච්.කේ. සිරිතුංග
බී.ඊ.ඊ.ඒ ප්‍රනාන්දු

03. 2006 න් පසු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප 2006 යොදාගත් පදනම මත 2016 දක්වා යාවත් කාලීන කිරීම හා සාධාරණයක් ඉටු කිරීම.

| යෝජනාකරු | ස්ථිරකරු |
|---|---|
| ආරියදාස තන්ත්‍රිගේ | එම්.මඩිගසේකර |
| ඩබ්.පී.එස්. ප්‍රනාන්දු | ඩබ්.ආර්.එස්. මෙන්ඩිස් |
| එච්.කේ. සිරිතුංග | පී.ජේ.ද සොයිසා |

මහ බැංකු විශ්‍රාමික හැඳුනුම්පත මෙම හැඳුනුම්පත නිකුත් කිරීමේදී අවසන් වරට බැංකුව තුළ දී දරණ ලද තනතුරු යොදාගන්නා මෙන් ඉල්ලා සිටිමු.

| යෝජනාකරු | ස්ථිරකරු |
|---|---|
| එල්. කේ.එච්.එස්.දමයන්ත | එස්.එම්. යසනායක |

මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකයන් හට මහ බැංකුවේ වෙනත් විශ්‍රාමික සංගමයක නිලතල දැරීම අත්හිටුවීමට යෝජනා කරමු. එය සදාචාරාත්මක නොවන්නක් බවද සඳහන් කරනු කැමැත්තෙමු.

| යෝජනාකරු | ස්ථිරකරු |
|---|---|
| එල්. එදිරිසිංහ | එස්.එම්. යසනායක |

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයට අනුබද්ධ විද්වත් මණ්ඩලයක් පහත සඳහන් කරුණු අරභයා පත්කර ගැනීමට යෝජනා කරමු.

කාර්යය භාරය :

I. සංගමයේ සාමාජිකයින් වන, විශ්‍රාම යන විට දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඊට ඉහළ නිලයන් දරණ පද සාමාජිකයින් සිය කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්වේ.

II. ජාතික වැදගත්කමක් ඇති, ආර්ථිකයට හෝ මුල්‍ය ක්ෂේත්‍රයට බලපාන වැදගත් කරුණක් අල්ලා සාකච්ඡා කර මතයක් ඉදිරිපත් කිරීම. රජයට, මහ බැංකුවට හෝ මහජනතාවට

III. රූපවාහිනී වැඩසටහන් වලට සහභාගී වීම.

IV. පුවත්පත් වලට ලිපි සැපයීම.

V. මාධ්‍ය සාකච්ඡා වලට සහභාගී වීම
VI. ශ්‍රී ලංකා මහ බැංකුවට එල්ලවී ඇති තර්ජන වලදී ඒ වෙනුවෙන් ඉදිරිපත් වී වැරදි මති මතාන්තර නිවැරදි කිරීම.
VII. රජයේ නිලධාරීන්, මහජන නියෝජතයින් පාසල් ශිෂ්‍යයන් හෝ වෙනත් ඕනෑම නියෝජිත පිරිසක් යම් ප්‍රශ්නයක් අලලා දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් සම්පාදනය කිරීම.
VIII. මහ බැංකු අධිපති පත්කිරීමේදී, රජයට නියෝජිතයන් ඉදිරිපත් කිරීම.
IX. රජයට මහ බැංකුවට උපදෙස් සැපයීම.

යෝජනාකරු : ලක්ෂ්මන් ද සිල්වා
ස්ථිරකරු : ජයත් කාරියවසම්

**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ සාමාජිකත්වය වෙත ඉදිරිපත් කරනු ලබන**

## ගරු ස්වාධීන විගණකගේ වාර්තාව

මා වෙත ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ ශේෂ පත්‍රයන් ආදායම්, වියදම් ගිණුමත්, පැහැදිලි කිරීමේ සටහනුත් විගණනයට භාජනය කරන ලදී.

මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට අවශ්‍ය කරන සියලුම පැහැදිලි කිරීම් හා තොරතුරු මා විසින් ලබා ගන්නා ලදී. ඉදිරිපත් කර ඇති මුල්‍ය ප්‍රකාශනයන් පිළිගත හැකි තත්ත්වයෙන් ඉදිරිපත් කර තිබූ අතර ඒවා බලපෑම් කළ හැකි තරමේ මගහැරීම්වලින් හා වංචා හෝ වැරදිවලින් නිදහස්ය.

මා විසින් කරුන ලද විමර්ශනයේ හැටියට සංගමය විසින් විධිමත්ව හා නිවැරදිව තොරතුරු පවත්වාගෙන ගොස් ඇති අතර 2016 දෙසැම්බර් මස 31 දිනට ඉදිරිපත් කර ඇති මුල්‍ය ප්‍රකාශන මගින් සත්‍ය හා නිවැරදි තොරතුරු ප්‍රකාශයන් පිළිබිඹු කරන අතර එම දිනෙන් අවසන් වන වසර සඳහා නිවැරදි අදායම් තත්ත්වයක් දක්වා ඇත.

අත්සන් කළේ : කේ. ජෙගනාදන්<br>ගරු විගණක

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
## 20161231 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| වියදම් | සටහන | 2016 | 2015 | ආදායම් | සටහන | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| සංගමයේ සහනාධාර | | | | | | | |
| විශේෂ මහ සභා රැස්වීම | | 125250.00 | 129000.00 | සාමාජික ගාස්තු | | 1272400.00 | 1243100.00 |
| තුන්දින චාරිකාව | 1 | 125078.00 | 76970.00 | වැන්දඹු හා අනත්දරු | | 74800.00 | 84500.00 |
| එක්දින චාරිකාව | 2 | 79000.00 | 53290.00 | දායක මරණාධාර | | 513200.00 | |
| පරිත්‍යාග | | | | පොලී ආදායම | | | |
| මරණාධාර | 3 | 525000.00 | 425000.00 | ස්ථාවර තැන්පතු පොලිය | | 155267.00 | 146236.00 |
| දායකත්වය මරණාධාර | 4 | 513200.00 | | | | | |
| රෝගී සාමාජිකයන් හමුවීම | | 3795.00 | 40000.00 | | | | |
| අනෙකුත් වියදම් | | | | ඉතිරි කිරීමේ ගිණුම් පොලිය | | | |
| සංග්‍රහ | | 30169.00 | 11337.00 | හැ.නැ. බැංකුව | | 1587.00 | |
| සැඳෑව | | 46480.00 | 62300.00 | සම්පත් බැංකුව | | 5813.00 | 6609.00 |
| මුද්දර හා තැපැල් ගාස්තු | | 65830.75 | 58235.00 | | | | |
| මුද්‍රණ ගාස්තු | | 51143.00 | 29184.00 | භාණ්ඩාගාර බිල්පත් පොලිය | | | |
| බැංකු ගාස්තු හා කොමිස් | | 1161.58 | 575.00 | සම්පත් බැංකුව | | 13526.00 | |
| වෙබ් අඩවිය | | 4500.00 | 4500.00 | හැ.හැ. බැංකුව | | 78121.00 | 42974.00 |
| ප්‍රාදේශීය සංවිධාන | | 2150.00 | 14240.00 | | | | |
| ලිපි ද්‍රව්‍ය | | 6593.00 | 11978.00 | | | | |
| ඡායා පිටපත් | | 2338.00 | 6010.00 | | | | |
| ප්‍රවාහන | | 15103.00 | 6520.00 | | | | |
| ක්ෂය වීම | | 111.00 | 278.00 | | | | |
| අනෙකුත් වියදම් | | 49233.00 | 23345.00 | | | | |
| වියදමට වඩා ආදායම | | 468578.67 | 570657.00 | | | | |
| | | 2114714.00 | 1523419.00 | | | 2114714.00 | 1523419.00 |

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
## 20161231 දිනට ශේෂ පත්‍රය

| වගකීම් | සටහන | 2016 | 2015 | වත්කම් | සටහන | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | | 4082578.20 | 3511921.20 | කාර්යාල උපකරණ | | 1003.00 | 1114.00 |
| වියදමට වැඩි ආදායම | | 468578.67 | 570657.00 | ආයෝජන | | | |
| අවශ්‍ය පුද්ගලයන් සඳහා | | | | ස්ථාවර තැන්පතු | | 2687952.40 | 2539736.40 |
| වූ අරමුදල | | 6210.00 | 6210.00 | භාණ්ඩාගාර බිල්පත් | | 1254016.53 | 775896.00 |
| වකුගඩු ආධාර අරමුදල | | | 46000.00 | | | | |
| සූරියකන්ද චාරිකාව | | 85000.00 | | ජංගම වත්කම් | | | |
| සඳහා ලැබීම් | | | | ස්ථාවර තැන්පත්වලින් | | | |
| | | | | ලැබිය යුතු පොලිය | | 30775.00 | 23724.00 |
| | | | | මල්වඩම් වෙනුවෙන් මහ | | | |
| | | | | බැංකුවෙන් ලැබිය යුතු | | 75565.00 | 34215.00 |
| | | | | බැංකු ශේෂ | | | |
| | | | | හැ.හැ. බැංකුව ජ.ගිණුම | | 386862.01 | 567191.12 |
| | | | | හැ.නැ. බැංකුව ඉ.ගිණුම | | 50174.24 | 48587.24 |
| | | | | සම්පත් බැංකුව ඉ.ගිණුම | | 142476.69 | 123137.69 |
| | | | | අතැති මුදල් | | 13542.00 | 21186.75 |
| | | 4642366.87 | 4134788.20 | | | 4642366.87 | 4134788.20 |

.................................................. ........................................................ ..............................................................

ගරු සභාපති ගරු භාණ්ඩාගාරික ගරු ගිණුම් පරීක්ෂක

**සටහන 01**

2016 පෙබරවාරි 27 දින දඹුල්ලේ 3 දින චාරිකාව සඳහා වු වියදම් පහත දැක්වේ. මෙහිදි ගමන් ගත් බස් රථය සඳහා ප්‍රවාහන ගාස්තු මහ බැංකුවෙනි.

| | | |
|---|---|---|
| සහභාගි වු අයගෙන් ලැබීම් | රු. | 499.000/ |
| <u>වියදම්</u> | රු. | |
| හෝටල් ගාස්තු | රු. | 602,278/ |
| වෙනත් වියදම් | රු. | 21800/ |
| | | 624,078/ |
| සංගමයේ සහනාධාරය | රු. | 125,078/ |

**සටහන 02**

20160820 දින කලටුවාව සෙරිනිටි ලෙෂර් පාර්ක් හෝටලයට දිනක සංචාරයක් යෙදුන අතර ඒ සඳහා වු වියදම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සහභාගී වූ අයගේ ලැබීම් | රු. | 218,000/ |
| වියදම් | | |
| හෝටල් ගාස්තු | රු. | 198,060/ |
| බස්රථ (බස්රථ තුනක් සඳහා) | රු. | 57,000/ |
| සංගීත කණ්ඩායම | රු. | 15,000/ |
| වෙනත් | රු. | 26,940/ |
| සංගමයේ සහනාධාරය | රු. | 79,000/ |

**සටහන 03**

2016 වර්ෂය තුළ රු. 25,000/ බැගින් රු. 525,000/ ක් පහත දැක්වෙන සාමාජිකයින් 21 අභාවයන් වෙනුවෙන් අවමංගල්‍යාධාර ලෙස ගෙවා ඇත.

| විශ්‍රාමික අංකය | නම |
|---|---|
| 513 | එම්.ඩබ්.එස්.ඩියුරන් සිල්වා මහතා |
| 806 | ඩී.කේ. ප්‍රේමරත්න මහතා |
| 3685 | එස්.එස් ගුණවර්ධන මහත්මිය |
| 3494 | කේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා |
| 87 | කේ.ඩී.එස්.වයි. පෙරේරා මහත්මිය (වැ.අ) |
| 3008 | එච්.කේ.එන්.සී. පියරත්න මහත්මිය |
| 603 | ඩබ්. ජ්.ජ්. රොද්‍රිගො මහතා |
| 508 | ජේ.ජ්. පියසිරි මහතා |
| 3654 | ර්.එම්.ජී.බී. ඒකනායක මහතා |
| 3456 | යූ.එල්.එන්. ලක්ෂමන් මහතා |
| 3674 | එන්.එල්.ඩී.ජ්. ක්‍රිෂ්ණරත්න මහතා |
| 571 | වයි.සී. ද සොයිසා මහත්මිය |
| 616 | එම්.කේ ධර්මදාස මහතා |
| 306 | කේ.එන්. වීරසේකර මහතා |
| 888 | ජ්.එම්.ධනපාල මහතා |
| 727 | ටී.ඩී.බී. තිලකරත්න මහතා |
| 614 | කේ.වී.ජේමසිංහ මහතා |
| 609 | කේ.එම්.ජේ. පෙරේරා මහතා |
| 952 | එච්.ආර්.පී. බණ්ඩාර මහතා |
| 38 | සංමුගසුන්දරම් මහත්මිය (වැ.අ) |
| 3575 | ඩබ්.ජී. පීරිස් මහතා |

**සටහන 04**

2016 වර්ෂය තුළ රු. 513,200/ ක් දායකත්ව මරණාධාර අරමුදලට බැඳී සිටි පහත දැක්වෙන සාමාජිකයන් වෙනුවෙන් ගෙවා ඇත.

| වි. අංකය | නම | මුදල |
|---|---|---|
| 623 | පී.එම්.ජේ. ප්‍රනාන්දු | රු. 51300/ |
| 123 | ඔලිවේරා අබේධීර | රු. 51300/ |
| 980 | පී.කේ.එන්.පෙරේරා | රු. 51300/ |
| 958 | කේ.ජ්.රූපසිංහ | රු. 51300/ |
| 603 | ඩබ්.ජ්.ජ්.රොද්‍රිගො | රු. 51300/ |
| 806 | ඩී.කේ.ප්‍රේමරත්න | රු. 51300/ |
| 508 | ජේ.ජ්.පියසිරි | රු. 51300/ |
| 3654 | ර්.එම්.ජී.බී.ඒකනායක | රු. 51300/ |
| 3454 | යූ.එල්.එන්.ලක්ෂමන් | රු. 51400/ |
| 3674 | එන්.එල්.ඩී.ජ්. ක්‍රිෂ්ණරත්න | රු. 51400/ |
| | | රු. 513200/ |

# CENTRAL BANK PESIONERS' ASSOCIATION
## Office Beares - 2016

| | | |
|---|---|---|
| Hony. President | - | Mr. Jayalal Jayawardena |
| Hony. Vice President | - | Mr. Ariyadasa Thanthirige |
| Hony. Secretary | - | Mr. H.M.P. Herath |
| Hony. Asst. Secretary | - | Mr. Amarapala Karasinghe |
| Arachchi | | |
| Hony. Treasurer | - | Mr. R.D. Gunasena |
| Hony. Asst. Treasurer | - | Mr. L.L.M.D. Cabral |
| Hony. Committee Members | - | Mr. Jagath Kariyawasam |
| | | Mr. K.B. Dissakaruna |
| | | Mrs. Leela Maohansundaram |
| Hony. Social Secretary | - | Mrs. Ira Wegodapala |
| Hony. Auditor | - | Mr. K. Jeganathan |

# CENTRAL BANK PENSIONER'S ASSOCIATION

No. 2, Tissa Avenue, Off Quarry Road, Dehiwala
Tel : 0777 412 289
Date : 02.04.2017

---

Dear Members,

## ANNUAL GENERAL MEETING 2016

We forward here with following documents for your information.

01. Notice Convening the Annual General Meeting.
02. Annual Report 2016
03. Statement of Annual Financial Accounts 2016

You are cordially invited to attend the Annual General Meeting of our Association scheduled to be held on 30the April 2017 at the Center for Banking Studies (CBS) of the Central Bank of Sri Lanka at No. 58, Sri Jayawardanapura Mawatha, Rajagiriya. (programme agenda is attached)

Arrangements have been made to supply lunch free of charge for members at the canteen for Banking studies premises after the meeting.

Your Sincerely

| | |
|---|---|
| Jayalal Jawawardena | H.M.P. Herath |
| Hony.President | Secretary |

## CENTRAL BANK PENSIONER’S ASSOCIATION

No. 2, Tissa Avenue, Tel : 0777 412 289
Off Quarry Road, Dehiwala Date : 02.04.2017

---

## Notice

The Annual General Meeting of the Association will be held on Sunday 30 th April 2017 at the Center for Banking Studies, 58, Sri jayawardanapura Mawatha, Rajagiriya.
Registration of Attendance will commence at 9.00 a.m.

**AGENDA**

01. Lighting of the Traditional oil lamp.
02. Observance of two minutes silence in memory of all our departed colleagues.
03. Reading the Minutes of the previous AGM
04. Matters arising from the minutes.
05. Presentation of the Annual Report 2016 by the secretary.
06. Presentation of the Annual Financial Accounts 2016 by the Treasurer.
07. President's Address
08. Resolutions
09. Election of Office Bearers for the year 2017
10. Any other business

A welcome drink with a snack will be served at the meeting. The meeting will be followed by the fellowship lunch and it is expected to conclude around 3.00 p.m.

H.M.P Herath

Hony. Secretary

## Central Bank Pensioners' Association

## Annual Report 2016/2017

Today, I am pleased to present the Annual Report of the Association for the year 2016/2017. All of us served the Bank in various ways sacrificing our best period of life for the betterment of the country and to meet the objectives of the Bank. In turn we are always grateful to the Central Bank for looking after us even after our retirement.

I would like to thank the Members who were present at the last Annual General Meeting held on 12$^{th}$ March 2016 for electing me as your General Secretary. I would like to make an expression of gratitude to the former Governor, Mr. Arjuna Mahendran for the relief granted to the pensioners by enhancing their pensions parallel to the revision of the salaries of the current Bank employees, at least up to the year 2006 thereby creating a precedent. I would also like to appreciate the steps taken by the previous Office Bearers of our Association in this regard. The present Governor, Dr. Indrajith Coomaraswamy who was one of our Senior colleagues and an international economist, was always prepared to listen to our grievances despite his very tight schedule.

We met Dr. Coomaraswamy twice during the period. We met Mr. Arjuna Mahendran, former Governor on 20$^{th}$ August 2016 at the lunch that was hosted by the Association for both Mr. Mahendran and Dr. Coomaraswamy at the banquet hall of the Serinity Village Hotel, Kalatuwawa. Dr. Coomaraswamy however could not eventually make it for this occasion due to an unavoidable personal circumstances. However, we met him officially on 26$^{th}$ of September

2016 with DG/L, Mr. Lankathilaka as it is the convention of the Association to welcome a new Governor and he warmly received the members of the Executive Committee. Although it is not customary to present a Governor with a list of requests at the first meeting, on his sanction we submitted him a series of our issues. We had the second meeting with the Governor and DG/L along with the relevant Senior Officials of the Bank on 2nd March 2017. The following were present at the Meeting:

| On behalf of CBPA | On behalf of CB |
|---|---|
| 1. The President, Mr. Jayalal Jayawardena | Governor, Dr. Indrajith Coomaraswamy |
| 2. The Secretary, Mr. H.M.P Herath | Dep.Governor, Mr. S Lankathilaka (DG/L) |
| 3. The Treasurer, Mr. R.D Gunasena | Director Legal and Compliance, Mr. P.V.L Nandasiri |
| 4. Vice President Mr. Ariyadasa Thanthirige | Secretary of CB, Mr. K.H.A.S Ariyarathna |
| 5. Assistant Treasurer, Mr. L.M.M.D.Cabral | Director/SSMD, Mr. B.W.Jinasena |
| 6. Committee Members Mrs. L. Mohanasundaram and Mr. Jagath Kariyawasam | Director/HR, Mr. K.M Abeykoon |

| | Matters Discussed | Response of the Management of CB |
|---|---|---|
| 1 | Granting an office space for the Association | Part of the Basement of the Center Point Building at Fort was allocated. It will be ready by 1st of April 2017. |
| 2 | Not granting increments at the 60th Anniversary Celebration for officers who retired during the period 28th August 2010 to 30th September 2010 | Both Governor and DG/L agreed to look in to this matter |
| 3 | As the Association understands employees who retired before 2006 did not receive the statutory payment of Rs. 3500/- in the Pension Revision 2015. Hence they also should be given the payment. | Agreed to consider |
| 4 | The pensioners do not get the copies of the relevant regulations issued by the Bank by way of circulars. They can be dispatched along with the monthly pension advices. | Agreed to respond positively |

| | | |
|---|---|---|
| 5 | To have an officer at SSMD dedicated to provide information to Pensioners *via* telephone and to meet them at the Dept., as some pensioners' knowledge is poor on new medical facilities etc. | The existing arrangement will be strengthened to attend to this matter efficiently |
| 6 | Reservation of holiday Bungalows to be made to pensioners through representation or by post and to deduct the fees from the monthly pension | This has been implemented and the relevant circular on the matter is to be dispatched. |
| 7 | Some of pensioners may not have sufficient found to settle Bill of the hospital and to claim it from the Bank. | A Commitment Letter is issued and to advance paid the hospital by the Bank. |
| 8 | The employees who retired on the Second VRS were not given a lump sum payment at retirement and they also should be paid the same. | The second EVRS was on different conditions agreed before the retirement and thus does not qualify for a lump sum payment. |
| 9 | Grievances of employees who retired on the language issue. | The Governor would look in to this matter on compassionate grounds |

| | | |
|---|---|---|
| 10 | Appeal made by Mrs. Padma Gunasekara who had gone abroad for employment. | This VOP case and the benefits she was entitled to such as EPF etc were paid in December 1963 after she left. Further, a VOP cannot be entertained since such situations do not help to sustain a public organization. |
| 11 | The Association has received information that income of employees of the Bank and the Pensioners whose reimbursement of the cost of medical benefits will be taxed from the next financial year. | The Governor and DG/L said that a positive response is being considered by the Bank and is awaiting the approval of the higher Authorities. |

With regard to the above item (11) the President and I did some research on the subject, and dispatched a letter to the Governor before this meeting (Attachment 01). Our research found that, in *K.Kanagasabapathy Vs Commissioner General of Inland Revenue* SC No.16/79-CA 2/77- Inland Revenue BRA368 (Reported in Sri Lanka Tax Cases Vol IV) it was decided that medical benefits an employee is entitled to as reimbursement are not taxable.

The Executive Committee has suggested to the Governor at the last meeting held with him to consider an appointment of an eminent retired judge acceptable to the general public as a legal consultant of the Bank not below the rank of a Court of Appeal on par with the status of a Deputy Governor. Earlier the Bank had such

consultants who advised the management of the Bank to look at the both sides of the legality of major Actions.

During the year, we had social and charitable events. First was the launch of a booklet titled '*Oba Thawamath Suwanda Malaki*' ('You are still a Fragrant Flower') containing poems penned by one of our pensioners whose pen name is '*Gomi*', at an event hosted by the Association. He had been writing poems since his youth and a collection of them was launched on 1st June 2016, at the Auditorium of the Training Center, Rajagiriya. The Chief Guest for the occasion was Prof. Praneeth Abeysundera of the Jayawardenapura University. It was a sentimental journey going back to the early '60s for the pensioners as well as the employees of the Bank. The proceeds of the sale of the compilation of the poems and the contributions made by the members of the Association and Gomis' well-wishers amounting to Rs. 292,000/- was delivered to the Maharagama Cancer Hospital to purchase the much needed Pet-Scan Machine by the President and the event was initiated by Mr. Yasapala Perera. Mr. 'Gomi' is non other than Mr. T.A.G Gomis who is suffering from a terminal illness and is living in Kadawatha. We wish him good health and blessings of the triple gem. We thank Mr. Yasapala Perera for initiating and helping us in this noble cause.

Secondly, in June 2016 school books and stationary's valued at Rs. 32,000/- were donated to the Chief Incumbent Thero of Bimbaramaya Temple, Kadawatha for the benefit of children affected by the floods, from the contributions made by the Members of the Association livingaround Kadawatha, since the pensioners of other areas had already made their contributions to this cause as individuals and Groups.

I have to mention here that our network of branches, Piliyandala, Galle and Matara are functioning well. President and at least two of the office bearers have attended their meetings.

The one day trip of the Association was organized to Serenity Villege Hotel, Kalatuwawa to have a get together for the old and new pensioners and their family members and to host the former Governor Mr. Arjuna Mahendran and to welcome the present Governor, Mr. Indrajith Coomaraswamy on 20th August 2016. Everybody enjoyed the day enthusiastically. Very old members of the Association appreciated the arrangements and reminisced the memories during the formative years of the Bank while it was a new experience for the new pensioners who shared their memories at the Bank with them. After Mr. Mahendren left the event wishing good and prosperity for the members, they started dancing to the tune of the band of musician.

Rupees 105,000 donated to the Thelingu village in the North Central Province for the development for the supplying water and other sanitary facilities on the request of VRS association's President and approval of our Executive Committee.

A three day trip was organized by the Association from 3rd to 5th March 2017 to Suriyakanda where residential and banquet facilities are available at St. John Mary Vianney Clergy House. The Members enjoyed their stay there as the weather was cooler near the Sinharaja Forest. On the second day night a musical evening was held with the attendance of a band which came from Colombo. The evening cold weather was offset by the dancing that followed to the tune of music. During this trip the Members got the opportunity to visit the only manor house in Sri Lanka, **Maduwanwela Walawwe** which exists

from the days of the Sinhala kings. Journey back to Colombo was through Tangalle and a sumptuous lunch was offered at Ceylon Sea Hotel. Some of the members enjoyed swimming in the Tangalle Bay.

During the year the Members of the Web Committee updated the website of the Association by incorporating therein the Constitution of the Association. The Committee is in the process of organizing the information of the members to be uploaded into the Association's website along with the specimens of the medical claim forms etc.

During the year members of the Executive Committee visited the houses of senior members of our Association who are in their advance age included Mr. J.M. Podi Appuhamy at Enderamulla, Mr K.T. Sirisena at Kiribathgoda, Miss. Patricia Nelson who is treated at the Kalubowila General Hospital is being looked after by a Doctor whose father is a Committee Member. The oldest pensioner of the Bank, Mr. H.E. Gunawardena who was 107 years old, passed away on 16th March 2017.

The Association published four volumes of 'Sendewa' during the year incorporating major events relevant to the Members of the Association that took place. I would like to thank the editor of 'Sendewa' Mr. Amarapala Karasingharchchi and the 'Sendewa' Committee for their excellent work in compiling the Magazine of the Association.

I have to thank the Governor, Dr. Coomaraswamy on behalf of the Executive Committee for the attention he paid to our grievances and solving issues that brought to his consideration. Deputy Governor Mr. Lankathilaka who coordinated the matters on the subject of the Association together with the Senior Officials of the Bank. I thank D/

L & C-Mr. Nandasiri, the Secretary of the Bank- Mr. Ariyaratna, D/SSMD- Mr. Jinasena, D/HR-Mr. Abeykoon, D/FMD-Mr. H.B.D Karunaratna and his staff, Ms. S.H Gunawardena and her staff, Mr. U.H.E. Silva, Director of the Center for Banking Studies and his staff for their assistance in various ways in the activities in connection with the Pensioner's Association.

Finally I take this opportunity to thank the members of the Executive Committee who encourage us to successfully complete the assigned task and the other members who help us in numerous ways.

H.M.P Herath

**The Secretary**

## Independent Hony. Auditor's report the members of the Central Bank Pensioners' s Association.

## Reports on the Financial Statement

I have audited the accompanying financial statements of the Central Bank Penioners' Association which comprises the blance sheet as at 31 st December 2016 and the income expenditure and the explanatory notes to the Accounts. I have obtained all the information and explanation which to the best of my knowledge and belied where necessary for the purpose of my audit. The financial Statement is a fair presentation and is free from the material misstatement whether due to fraud and error.

In my opining so far as appears from my examination. The association maintained proper accounts, records for the year ended 31 st December 2016 and the financial statement give a true and fair view of the Association's state of the affairs at 31 st December 2016 and it income for the year.

Signed by
Mr. K.J. Jagemathan
Hony. Auditor

## Central Bank Pensioner's Association
## Income & Expenditure Account for year ended 31-12-2016

| Expenditure | Note | 2016 | 2015 | Income | Note | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| Subsides | | | | | | | |
| AGM | | 125250.00 | 129000.00 | Pensioner Contribution | | 1272400.00 | 1243100.00 |
| Three day trip | 1 | 125078.00 | 76970.00 | W&OP/RP | | 74800.00 | 84500.00 |
| One day trip | 2 | 79000.00 | 53290.00 | | | | |
| Donation | | | | | | | |
| Death Donation | 3 | 525000.00 | 425000.00 | Contributor D.D. | | 513200.00 | |
| Co. Death Donation | 4 | 513200.00 | - | | | | |
| Visiting sick people | | 3795.00 | 40000.00 | Fixed Deposit Interest | | 155267.00 | 146236.00 |
| | | | | HNB saving Interest | | 1587.00 | |
| Other Expenses | | | | Sampath Bank | | 5813.00 | 6609.00 |
| Refreshment | | 30169.00 | 11337.00 | | | | |
| Sandewa | | 46480.00 | 62300.00 | Treasury Bills | | | |
| Stamp & Postage | | 65830.75 | 58235.00 | Interest Sampath Bank | | 13526.00 | |
| Printing | | 51143.00 | 29184.00 | Interest HNB | | 78121.00 | 42974.00 |
| Bank charges | | 1161.58 | 575.00 | | | | |
| Website | | 4500.00 | 4500.00 | | | | |
| Regional Org. | | 2150.00 | 14240.00 | | | | |
| Stationary | | 6593.00 | 11978.00 | | | | |
| Photocopy | | 2338.00 | 6010.00 | | | | |
| Transport | | 15103.00 | 6520.00 | | | | |
| Depreciation | | 111.00 | 278.00 | | | | |
| Other | | 49233.00 | 23345.00 | | | | |
| Income over expenses | | 488578.67 | 570657.00 | | | | |
| | | 2114714.00 | 1523419.00 | | | 2114714.00 | 1528419.00 |

## Central Bank Pensioner's Association
## Income & Expenditure Account for year ended 31-12-2016

| Liabilities | Note | 2016 | 2015 | Assets | Note | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| Accumulated fund | | 4082578.20 | 2511921.20 | Office Equipment | | 1003.00 | 114.00 |
| Income over expenses | | 468578.67 | 570657.00 | Investments | | | |
| | | | | Fix Deposits | | 2687952.40 | 2539736.40 |
| Funds for Need persons | | 6210.00 | 6210.00 | Treasury Bills | | 1254016.53 | 775896.00 |
| Kidney fund | | | 46000.00 | | | | |
| Cash payment for | | | | | | | |
| Suriya Kanda | | 85000.00 | | Current Assets | | | |
| | | | | Interest receivable from | | | |
| | | | | Fix deposit | | 30775.00 | 23724.00 |
| | | | | To be collected from | | | |
| | | | | CB on wreaths | | 75565.00 | 34215.00 |
| | | | | Bank Blance | | | |
| | | | | HNB Current A/C | | 386862.01 | 567191.12 |
| | | | | HNB Saving A/C | | 50174.24 | 48587.24 |
| | | | | Sampath Bank | | 142476.69 | 123137.69 |
| | | | | Cash in hand | | 13542.00 | 21186.75 |
| | | 4642366.87 | 4134788.20 | | | 4642366.87 | 4134788.20 |

Hony. President

Hony. Treasurer

**Note 01**

3 Day trip was to Dambulla on 27 th February 2016. The cost of two busses was paid by the Central Bank. The summary of the account is as follows.

| | | |
|---|---|---|
| Collection from the participants | - | 499 000.00 |
| Expenses | | |
| Paid to the Hotel & Restaurants | - | 602 278.00 |
| Other payments | - | 21, 800.00 |
| | | 624,078.00 |
| **Subsidized Amount** | **-** | **125,078.00** |

**Note 02**

One day trip was to serenity Lesure Park Hotel at Kalatuwawa on 20.08.2016 The summary of the account is as follows.

| | | |
|---|---|---|
| Collection from the participants | - | 218,000.00 |
| Expenses | | |
| Hotel Charges | - | 198,060.00 |
| Transport (3 busses) | - | 57,000.00 |
| Band (Music) | - | 15,000.00 |
| Others | - | 26,940.00 |
| | - | 297,000.00 |
| **Subsidized Amount** | **-** | **79,000.00** |

## Note 3

During the year 2016 a sum of Rs. 525,000/- was paid on the death of the following members.

| | | |
|---|---|---|
| 1. | 513 | M.W.S. Duran de silva |
| 2. | 806 | D.K. Premaratna |
| 3. | 3685 | Mrs. S.S. Gunawardena |
| 4. | 3494 | K.L.S. Fernando |
| 5. | 87 | Mrs. K.D.S.Y. Perera (W&OP) |
| 6. | 3008 | Mrs. H.K.N.C. Piyaratna |
| 7. | 603 | W.A.A. Rodrigo |
| 8. | 508 | J.A. Piyasiri |
| 9. | 3654 | E.M.G.B. Ekanayake |
| 10. | 3456 | U.L.N. Luxman |
| 11. | 3674 | N.L.D.A. Krisharatna |
| 12. | 571 | Mrs. Y.C.De Zoyza |
| 13. | 616 | M.K. Dharamadasa |
| 14. | 306 | K.N. Weerasekara |
| 15. | 888 | A.M. Dhanapala |
| 16. | 727 | T.D.B. Thilakaratna |
| 17. | 614 | K.V. Premasinghe |
| 18. | 609 | K.M.J. Perera |
| 19. | 952 | H.R.P. Bandara |
| 20. | 38 | Mrs. Shanmuga Sudaram (W&OP) |
| 21. | 3575 | W.G. Peirs |

## Note 4

During the year 2016 a sum of Rs. 513200 was paid on the death of the following members under the contrubutory death donation fund.

| Pension No | Name | Amount |
|---|---|---|
| 623 | P.M.J. Fernando | 51 300 |
| 123 | Olivera Abeydeera | 51 300 |
| 980 | P.K.N. Perera | 51 300 |
| 958 | K.A. Rupasinghe | 51 300 |
| 603 | W.A.A. Rodrigo | 51 300 |
| 806 | D.K. Premarata | 51 300 |
| 508 | J.A. Piyasiri | 51 300 |
| 3654 | E.M.G.B. Ekanayake | 51 300 |
| 3454 | U.L.N. Laxman | 51 400 |
| 3674 | N.L.D.A. Krishnaratha | 51 400 |
| | | **513 200** |

1st February 2017

Dr. Indrajit Coomaraswamy
Governor
Central Bank of Sri Lanka.

Dear Sir,

**Deduction of Income Tax from pensioners of the Central Bank.**

Present practice is that to pay the income tax component on behalf of the Pensioners by the Central Bank.

This was agreed at the every negotiation table with the management and unions of the Central Bank in respect of salary increase.

However, it was brought to our notice that the present staff would be given a tax free allowance of Rs.1,200,000/- while pensioners would be given a tax free allowance of only Rs.500,000/- per year from 1st April 2017 and the balance amount to be taxed from the pension.

This will bring our members to a lot of hardships and inconveniences. As senior retired officers, our members already spend a lot of money on their medical bills and as it is, our members find it difficult to sustain their normal life.

Therefore, we earnestly request you not to change the present practice of payment of income tax of pensioners.

Thank you,

Yours faithfully,

President — Secretary

cc.- Mr. Sunil Lankathilake, Deputy Governor

Received 1/2/17

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
# Central Bank Pensioners' Association